

**‘මා නිවත්ත අභික්කම’ – නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **58 වන කාණ්ඩය** | **බු.ව. 2559 දුරුතු මස පුරපසළොස්වකදා ක්‍රි.ව. 2016 ජනවාරි මස 23 වන දා** | **09 වන කලබ** |

# නව වසරට අලුත් ඉරක්



ඉරත් උදා විය දුරු කර බොල් තුසර
කොළත් මලුත් නවමුව පිබිදෙයි පැතිර
රටත් ගමත් නැගුමට නැගිටිමු මෙ වර
අලුත් විය හැකි ද ඔබටත් මේ වසර

අලුත් ලෙස හිතමු අදිටන් පෙරටු කොට
අරුත්වත් සිතුම් පණ ගන්වමු සිතට
අලුත් අලුත් නිමැවුම් ගෙන එමු රටට
දෙඅත් අල්ලගෙන අපි යමු යමු පෙරට

**- අනඳ -**




අග්ගමහා පණ්ඩිත වැලිගම ඤාණරතන මහා නායක
ස්වාමින්ද්‍රයන් වහන්සේ විසිනි.

(පසුගිය කලබ හා සබැඳේ)

## උපට්ඨිත සති හෝති

සත්පුරුෂ ගුණ අතර හවැනි ගුණය එළඹ සිටි සිහි ඇති බව යි. එළඹ සිටි සිහිය යි කියන්නේ හැම ඉරියව්වෙක්හි ම සිහියෙන් යුක්ත වීමයි. ලෞකික ලෝකෝත්තර හැම දියුණුවට ම සිහිය තරම් ප්‍රයෝජන ඇති වෙන ධර්මයක් නැති තරම් ය. අධික නුවණ ඇත්තකුට වැඩි වැඩියෙන් පාඩම් කළහැකි වුවත් හොඳින් සිහිය නැත්නම්, ඒ හැම පාඩමක් ම අමතක වන්නේ ය. එබැවින් නුවණටත් වඩා සිහිය අවශ්‍යබව කිව යුතු ය. **"සතිඤ්චඛවාහං භික්ඛවේ සබ්බත්ථිකං වදමි"** යනුවෙන් බුදුරජාණන් වහන්සේ සිහිය හැම තැනට ම - හැම දෙයට ම වුවමනාවේය'යි දේශනා කළ සේක. හැම ව්‍යඤ්ජනයකට ම ලුණු අවශ්‍ය වන්නාසේ ම හැම තැනට ම සිහිය අවශ්‍ය වන්නේ ය. සිහිය වැඩිය යුතු - දියුණු කළ යුතු ධර්මයෙකි. භාවනායෙන් කරන්නේ මේ සිහිය දියුණු කිරීම සහ පුරුදු කිරිම යි. **අපිලාපන - උපගණ්හන** යන ලක්ෂණ දෙක සිහියේ ලක්ෂණයි. එහි **අපිලාපන** - ලක්ෂණ නම්: සිතින් ගන්නා වූ අරමුණු අමතක වන්නට නොදී

රැක ගැනුමයි. **උපගණ්හන** - නම්ː මේ හිතකරය, මේ අහිතකරය යන වශයෙන් වෙන් කොට දැන හිතකරයන් ලංකර ගැනීමයි.

මේ සිහිය ජීවිතයට පුරුදුකර ගැනීම ඉතා ම අවශ්‍ය කාරණයක් බව තථාගතයන් වහන්සේ ප්‍රකාශ කරන සැටි සතිපට්ඨාන සංයුත්තයෙහි වන්නේ ය. එය සංක්ෂේපයෙන් මෙසේ ය. "ජනපද කල්‍යාණිය දක්නට මහාජනකායක් රැස්වන්නේ ය, ඔවුනතර තදින් ජීවිතාසාව ඇති සැප කැමති එක් මිනිසෙක් ද එහි පැමිණෙන්නේ ය, ඔහුට සම්පූර්ණයෙන් පිර වූ තෙල් පාත්‍රයක් පෙන්වා ඔබ මේ තෙල් පාත්‍රය මේ මහා ජනකායට ත් ජනපද කල්‍යාණියට ත් අතරින් ගෙන යා යුතු ය, එසේ ගෙන යන විට තෙල් බින්දුවක් වත් බිම වැටුණා නම්, එතැනදී ම තගේ හිස කපා හෙලමි යි, පවසමින් යම්සේ වධකයෙක් ලුහු බඳී ද, මහණෙනි ඒ තෙල් පාත්‍රයෙන් බින්දු මාත්‍රයක් වත් බිම වැටුණොත් හිස සිඳිමියි කියන වධකයකු පසු පස එන විට ඒ පුරුෂයා සිහියෙන් තොර ව ගෙන යන්නේ දැ යි තථාගතයන් වහන්සේ භික්ෂූන් ගෙන් ඇසූහ, එවිට භික්ෂූන් වහන්සේ ස්වාමිනි, බුදුරජාණන් වහන්ස, එබඳු කඩුගත් වධකයකු ලුහුබඳින කල්හි ජීවිතාසාව බලවත් ව ඇති ඒ තෙල්පාත්‍රය ගෙන යන තැනැත්තා ඒකාන්තයෙන් ම මනා සිහියෙන් යන්නේය යි පිළිතුරු දුන්හ, මහණෙනි එසේ ම කා විසිනුත් කායගතාසති භාවනායෙන් යුතුව ම විසිය යුතුය" යි දේශනා කළ සේක, මෙසේ මේ උපමාව දේශනා කෙළේ හැමවිට ම සියල්ලන් විසින් ම සිහියෙන් විසිය යුතු බව ප්‍රකාශ කිරීමට ය, යම් මොහොතක සිහියෙන් තොරව වෙසේ නම්, එවිට ක්ලේෂමාරයන් විසින් ඔහු බැඳගන්නවා

ඇත, ඒ ක්ලේශමාරපාසයට අසුවූවහුට සසර දුකින් නිදහස් වීමක් නැත.

**"යථා කණ්ඨක ඨානම්හි - චරෙය්‍ය අනුපාහනො,**
**සතිං උපට්ඨපෙත්වාන - ඒවං ගාමේ මුනී චරෙ "**

කටු තිබෙන තැනෙක වහන් පයැ ලා නොගත්තකු යම් තරම් සිහියෙකින් යා යුතු ද? ගමෙහි හැසිරෙන භික්ෂුව ද එතරම් ම සිහි ඇතිව ගමෙහි හැසිරිය යුතු බව මේ ථේරගාථා දේශනායෙන් පෙනේ. යමෙක් සිහි එළවා වාසය නො කෙරේ නම්, හෙතෙම බුදු සසුන්හි පැවිදිව විසුවත් නියම ප්‍රයෝජනය ලබා ගත නොහැක්කෙකි. කවර මොහොතකදී වත් සිහියෙන් තොරව ක්‍රියා නො කළා වූ බොහෝ උතුමන් ගේ චරිත කථා බෞද්ධ සාහිත්‍යයෙහි නොයෙක් තැනැ දක්නට ලැබේ. මහ පුරුෂයන් ගේ සිතුිවිලි ප්‍රකාශ කරන බුදුරජාණන් වහන්සේ මේ සිහිය ගැන -

**"උපට්ඨිත සතිස්සායං ධම්මො නායං ධම්මො මුට්ඨස්සතිස්ස,"** මේ නව ලොවුතුරා දහම ලැබගත හැකිවනුයේ එළඹසිටි සිහි ඇත්තාට මිස සිහි මුළාවන්නහුට නොවේ යයි දේශනා කළ සේක. එබැවින් ඔබ හැම, බුදුරජාණන් වහන්සේ පෙන්නාදුන් මඟ හරියට ගමන් කරනවා නම්, පසුගිය දේ සිහි නොකිරීම - අඩු සිහි ඇත්තන් ඇසුරු නොකිරීම - සිහි ඇත්තන් ආශ්‍රය කිරීම - සිහිය දියුණු කිරිමෙහි යෙදීම යන මේ කරුණු පුරුදු කොට ම හොඳින් එළඹ සිටි සිහි ඇත්තෝ වෙත්වා!

**ලබන කලබට**



# බෝධිසත්ත්වගුණෝපේත අතිපූජ්‍ය අත්තුඩාවේ සිරි ධම්මරක්ඛිත මහාස්වාමීන්ද්‍රයන් වහන්සේ

අතිපූජ්‍ය තිරිකුණාමලේ ආනන්ද මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

බෝධිසත්ත්ව ගුණෝපේත වැලිතර ඥාණවිමලතිස්ස මහාස්වාමීන්ද්‍රයන් වහන්සේ බු. ව. 2346 දී ශ්‍රී ලංකාවේ අමරපුර භික්ෂු වංශය ඇරැඹීමෙන් පසු එබඳු ම වූ යුගපුරුෂ තෙර නමක් තවත් හෙරණුන් පස් නමක් සමඟ බුරුමයට වැඩම කොට එහි අමරපුර සුවණ්ණගුහා සීමා මාලකයෙහි උපසම්පදාව ලැබ නැවත ලක්දිවට වැඩම කොට දෙවිනුවර පරමවිචිත්‍රාරාමය මූලස්ථානය කොට අලුත් සංඝ මූලස්ථානයක් ආරම්භ කෙළේ ය. වැලිතර ඥාණවිමලතිස්ස මහා යතීන්ද්‍රයන් වහන්සේ විසින් එම පිරිසේ 'සංඝ පිතෘ' ලෙස නම් කරන ලද උන්වහන්සේ වූ කලී බෝධිසත්ත්ව ගුණෝපේත අත්තුඩාවේ සිරි ධම්මරක්ඛිත මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. එම සඟ පිරිස නිකායක් ලෙස පැවැත්වීමේ අදහසත්, එම නිකාය "ධම්මරක්ඛිතවංස අමරපුර නිකාය" ලෙස නම් කිරීමත් සිදු කරන ලද්දේ ද යථෝක්ත ඥාණවිමලතිස්ස

මාහිමියන් වහන්සේ විසින් ය. ඒ බුද්ධ වර්ෂ 2361 ඇසළ මස අව තියවක් ලත් කිවි දින දී ය.

මාතර අත්තුඩාව නමැති රමණීය ගම් පියසේ දූවරුන් තිදෙනකු සහිත පවුලක එක ම පුතණුවන් ලෙස 1755 වසරෙහි දී උපත ලද ධම්මරක්ඛිත ස්වාමිපාදයන් වහන්සේ පැවිදි වූයේ වටගෙදර ශ්‍රී සුධර්මාරාම පුරාණ පිරිවෙන් පොත්ගුල් විහාරයෙහි දී එහි ආධිපත්‍යය දැරූ දෙහිගස්පේ අත්ථදස්සි මාහිමියන් වහන්සේ ගේ ආචාර්යත්වයෙනි. ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය කෙළේ එවක දකුණු පළාතේ පඬි රුවනක් ලෙස සම්භාවනයට පාත්‍ර ව පෙතංගහවත්ත විහාරාධිපතිව වැඩ වුසූ අතිගරු බෝවල ධම්මානන්ද මාහිමියන් වෙතිනි.

ඉගැනීම අවසන් කළ තුරුණු ධම්මරක්ඛිත හිමියෝ ඒ වන විට පෘතුගීසීන් විසින් විනාශ කරන ලද දෙවිනුවර කිහිරැළි විහාරය හෙවත් පරමවිචිත්‍රාරාමයට වැඩම කොට නැවත කටුකොහොල් අරවා කඩා බිඳ දැමූ චෛත්‍යය පමණක් පැවැති ඒ පුදබිම පිළිසකර කරවා එහි නවාතැන් ගත්හ. ලන්දේසි පාලනයෙන් ඉංග්‍රීසි පාලනයට පත්වෙමින් පැවති ඒ වකවානුවෙහි දම්රැකි හිමියන් ගේ ඉල්ලීම පරිදි පොල් ගස් දහයක් සහිත එම භූමි භාගය පවරා දෙන ලද්දේ නෝර්ත් ආණ්ඩුකාරවරයා විසිනි.

මේ අවධිය වන විට පැවිදි උපසම්පදාව එක පිරිසකට පමණක් සීමා කරගත් අශාසනික සම්මතයෙක් පැවැතිණි.

ඒ අනුව අත්තුඩාවේ හිමියනට පනස් එක් වන වියට පත්වන තුරු ද සාමණේර ව සිටින්නට සිදු විය. බෝවල ධම්මානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ යට කී නොසසුන් පිළිවෙත ගැන නොපහන්ව වැඩ විසූ මාහිමිපාණ කෙනෙකි. උන් වහන්සේ ධම්මරක්ඛිත හෙරණපාණන්ට බුරුමයේ (මියැන්මාරයේ) අමරපුර ඤාණාභිවංස ධම්මසේනාපති මහා රාජගුරු සඟ රජ මාහිමියන් වෙත පිළිගැන්වීම සඳහා පාළි ගාථා සන්දේශයක් රචනා කොට දී උන් වහන්සේ යටතේ උපසම්පදාව ලබා ගැනීමට කටයුතු පිළියෙල කර දුන්හ. මීට පෙර වැලිතර ඤාණවිමල හිමියනට බුරුමයට යෑමට අවස්ථාව සලසා දුන්නෝ ද මේ මාහිමියන් වහන්සේ ය.

බු. ව. 2350 දී අත්තුඩාවේ හෙරණපාණන්, පොල්වත්තේ හෙරණ, කිරින්දේ හෙරණ, මිරිස්සේ හෙරණ, වවුල්ලාවේ හෙරණ යන හෙරණුන් හා සලෝ උවසු සමඟ ගාලු වරායෙන් නැව් නැගුණේ ස්වකීය උතුම් අභිලාෂය ඉටු කරගැනීම පිණිස ය. බුරුම අමරපුර නුවර දී පිරිස ශාසන දයාවෙන් ඉහළින් පිළිගත් සඟ රජ මාහිමියන් වහන්සේ එවක මහා ධම්මරාජ රජුට ද දන්වා රාජකීය උත්සව ශ්‍රීයෙන් සුවණ්ණගුහා නම් සීමා මාලකයෙහි දී තමන් වහන්සේ උපාධ්‍යාය ව, වජිරඝෝෂ, ඤාණසක්ක, විමොක්ඛ යන මහ තෙරවරුන් ගේ කම්මවාචා ග්‍රහණයෙන් අත්තුඩාවේ ධම්මරක්ඛිත තිස්ස යන නමින් පැවිදි උපසම්පදාව ලබා දුන්හ. සෙසු හෙරණවරුන් (පොල්වත්තේ) සරණපාල තිස්ස, (කිරින්දේ) ධම්මානන්ද තිස්ස, (මිරිස්සේ) සුමතිසාර තිස්ස, (වවුල්ලාව) නන්දසාර

තිස්ස, (සලෝ උවසු) විමලබුද්ධි තිස්ස යන නම්වලින් උපසම්පදාවට පත් කළහ.

ඒ වන විටත් විනය පිළිබඳ වෙසරද දැනුමක් හිමි ව සිටි අත්තුඩාවේ ස්වාමීන් වහන්සේ ප්‍රධාන පිරිස සඟරජ මාහිමියන් ගේ මෙහෙයීමෙන් වජිරසෝෂ මාහිමියන් වෙත නිස සමාදන්ව, විනය කම් පුහුණු කරවා, පස් වසක් ගෙවුණු පසු අමරපුර නිරිඳුන්ගේ රාජකීය හරසර සහිත ව බු. ව. 2356 දී යළි ලක්දිව බලා එන්නට පිටත් වූහ. බුරුමයේ හංසවතියේ නේමියෝ මින් කියෝෂා ආණ්ඩුකාරවරයා ගේ විධානය පරිදි ලංකාවට ගොඩ බසින තෙක් ම සලසන ලද ආරක්ෂාව ඇතිව බු. ව. 2356 ඉල් මස අත්තුඩාවේ හිමියන් ප්‍රධාන පිරිස ලක්දිව සුවසේ සැපත් වූහ.

සිය සසුන් දිවියෙහි අගනා ම උපකාරයක් සැලසූ ගෞරවාර්හ බෝවල ධම්මානන්ද මාහිමියන් සිය ධර්මාන්තේවාසිකයාණන් ගේ සියලු තොරතුරු අසා මහත් සේ සොම්නස් ව බුරුම දෙසට හැරී දොහොත් නඟා දෙවරක් සාදුකාර දුන් බවක් සඳහන් වේ. එ මතු නො ව උන් වහන්සේ ගේ සිසුන් දෙ නමක් වූ හික්කඩුවේ සුමන, පෙතංගහවත්තේ සුගුණ යන සාමණේර දෙ නම ද උපසපන් කරවා ගෙන හදාගන්නා ලෙස උන්වහන්සේට ම පවරා දෙන ලදහ. ඒ දෙ නමට පසුව හක්මන ඉන්දසාර, අහංගම ධම්මරතන, සිහින්මෝදර සාරානන්ද, දෙවිනුවර (අංගහවත්තේ) රතනජෝති, කහඳවේ රතනසාර, බෙලිවත්තේ පඤ්ඤාසාර යන

පැවිදි සිසුන් ගේ ද ඇදුරුපාණන් වූවාහු ද අත්තුඩාවේ ධම්මරක්ඛිත මාහිමියෝ ය.

ලක්දිවට පැමිණි නො බෝ දිනෙකින් ම දෙව්නුවර පරමවිචිත්‍රාරාම විහාරයෙහි පොහොය සීමාවක් ද අත්තුඩාවේ හිමියන් ගේ ප්‍රධානත්වයෙන් සම්මත කර ගන්නා ලදුව ඉන් පසු උපසම්පද විනය කර්මයක් ද සිදු කොට ලක්දිව නූතන ශාසන වංශ කථාවට අලුත් ආලෝකවත් පරිච්ඡේදයක් එකතු කළෝ අත්තුඩාවේ සිරි ධම්මරක්ඛිත මාහිමියන් වහන්සේ ය. වැලිතර මාහිමියන් වහන්සේ ගේ නාම නියමය පරිදි එතැන් පටන් ආරම්භ වූ අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකාය අද දක්වා ම වෙන් නො වී ඒකීය නිකායක් ලෙස පැවතීම එහි ආදිකර්තෘන් වහන්සේට ගෞරව පිණිස පවතින මහනීය උපහාරයෙක් වෙයි.

**තව ගුණම'නුගන්තුං සබ්බකාලං යතාම**
**තව බහුජනකන්තං සන්තවුත්තිං භජාම**
**තව සුචි යතිවංසං රක්ඛිතුං උස්සහාම**
**තව සිරිචරණං අච්චන්තභත්‍යා නමාම**

(රාජකීය පණ්ඩිත ගෞරවාහී දෙණිපිටියේ චන්‍දජෝති අනුනාහිමිපාණන් වහන්සේ ගේ රචනයෙකි.)





# හැදුණොත් හොඳ දරුවකු ලෙස

පුෂ්පා ජයවර්ධන නැන්දා විසිනි.

උදෑ අරුණ නැගෙනා විට
පිපෙන සුවඳ මල් විලස ට
සිනා අරන් මුව මඬල ට
එන්න පුතුනි බෝ මළුව ට

වෙහෙර මළුව සුදු පාටට
සුදු මල් ඇතිරූ විලසට
සුවඳ දෙන්නේ ඔබ ආ විට
දුවේ පුතේ දම් මැදුරට

පොත පත පාඩම් කරන ට
ගුරු දෙගුරුන් නිති පුදන ට
ගුණදම් ගරු කොට රැකුම ට
අදිටන් කරගමු සැම විට

ගැමුණු අබා විරුවන් ලෙස
මෙහෙ කොට රට දැය සමයට
හැදුණොත් හොඳ දරුවකු ලෙස
දෙවියොත් හිස නමති ඔබට

ඔබ මහ බලයක් ය රටට
ඔබ සෙත් කවියක් ය දැයට
බස - රැස - දෙස හා සසුනට
ඔබ ගෙනි වැඩ වන්නෙ හෙටට



# උරුවෙල් කසුප් තෙරණු උදානය

**පොඩි හාමුදුරුවෝ විසිනි.**

අවුරුද්දක් ගෙවිලා අලුත් අවුරුද්දක් උදා වූ මේ කාලයේ හැමදෙනාම වගේ උත්සාහ කරනවා ජීවිතයට අලුත් මුහුණුවරක් ලබා දෙන්න. අලුත් අවුරුද්ද පටන් ගන්නේ නැකතට කිරි මුට්ටියක් එහෙම උතුරවලා. මේ විදිහට අවුරුද්ද සුබ වෙන්නට නොයෙක් විදියේ කටයුතු සිදු කරනවා. බොහෝ දෙනෙක් දිහා හොඳින් බැලුවොත් පෙනෙනවා ඒ හැමෝම අලුත් අවුරුද්දේ තමන්ගේ බාහිරය වෙනස් කර ගන්න වෙහෙසෙන බව. බාහිරය කියන්නේ, තමන් ගේ පෙනුම ඒ වගේ ම ජීවත් වෙන්නට වුවමනා බඩු බාහිරාදිය යි. ඇතුලතින් අලුත් වෙන්න එතරම් වුවමනාවක් නැහැ. තරමක හෝ වීර්යෙන් යුතු ව තමන්ගේ ජීවිතයට හොඳ ගුණ දහම් ටිකක් එකතු කරගන්න දක්ෂ වෙන අය මේ ලොකේ සිටින්නේ බොහෝ ම අතලොස්සක්. අනෙක් බොහෝමයක් පිරිස අලුත් අවුරුද්දක් උදාවෙනකොට සතුටින් ඉපිලෙමින් ඒ කාල වකවානුව ගෙවා දමනවා. සතුටින් සිටිනවා කියන කාරණාව බොහෝ ම හොඳ දෙයක්. ඒ වුණත් ටික දවසකින් නැවත කලින් සිටි විදිහට ම කුමන ආකාරයකින් හෝ උදා වූ ඒ අවුරුද්දත් ගෙවා දමන්න තමයි උත්සාහ කරන්නේ. ගුණ දියුණුවක්, නුගුණ හඳුනාගෙන ඒවා බැහැර කිරීමක්

ගැන සිතන්න පොඩි කාලයක්වත් මිඩංගු කරන්න බොහෝ දෙනෙක් පුරුදු වෙලා නැහැ.

නමුත් අවුරුද්ද පුරාම, හැම මොහොතකම සතුටින් ජීවිතය ගත කරන්නට පුළුවන් ක්‍රමෝපායක් කවුරුන් හෝ සොයා බලන්නට කැමති නම් ඒ පුද්ගලයා මේ ලෝකේ සිටින ප්‍රඥාවන්ත අයෙක් විය යුතු යි. නිවැරදි වූ පිළිවෙත හඳුනාගන්නට ඒ පුද්ගලයාට පුළුවන් වුනොත් ඔහු මෙලොව වගේ ම පරලොව දීත් බොහෝ සතුටට පත්වෙනවා. මහත් වූ භාග්‍යසම්පන්න පුද්ගලයෙක් වෙනවා. ඒ ලෙසින් මේ ලෝකේ හැමදාමත් සතුටින් සිටින පිරිසක් තවමත් අප අතර වැඩසිටිනවා. ඒ උතුමන් වහන්සේලා යම් තැනක වැඩ සිටිනවා නම් ඒ භූමිය පවා සුන්දරයි. මේ ලෝකයේ කොතැනක හෝ එවැනි අසිරිමත් උතුමන් බිහිවන්නේ බුද්ධ සාසනයක පමණයි. ඒ නම ඇසීමත් අපට මහත් වූ ශාන්තියක් උදාකර දෙනවා. රහතන් වහන්සේ නමින් යුත් ඒ උත්තම පුද්ගලයාට තිබෙන්නේ නිකෙලෙස් හදවතක්. මුලු ශරීරය පුරාම ඒ නිකෙලෙස් බව පැතිරිලා තිබෙනවා. ඒ නිසා හැම මොහොතක ම උන්වහන්සේ සතුටින් සිටිනවා. ඔබ අප හැමදෙනාගේ ම ශාස්තෘන් වහන්සේ මහා කරුණාවෙන් යුතුව යමක් දේශනා කර තිබෙනවා ද, ඒ ශාස්තෘ අනුශාසනාව ඉටු කරගන්නට මහා විශාල අතහැරීමක් සමඟ බලවත් කැමැත්තකින් යුතුව වීර්යයෙන් සරල සුන්දර පිළිවෙතක යෙදුණ නිසා උන් වහන්සේලාට මෙතරම් සතුටක් දායාද ලෙසින් ලැබුණා.

අදින් වසර ගණනකට පෙර අපගේ ශාස්තෘන් වහන්සේ ජම්බුද්වීපය නම් ශුද්ධ භූමියේ සිට උතුම් සදහම් පණිවුඩය රැගෙන මේ පුංචි දිවයිනට වැඩම කරන්නට යෙදුනේ අද වගේ උතුම් දුරුතු පොහොය දවසක යි. ඒවාගේ ම මහා

කරුණාවෙන් ප්‍රාතිහාර්ය දක්වමින් නිකෙලෙස් හදවත් ඇති තවත් උතුමන් පිරිසක් මේ ලොවට බිහි කරන්නට බුදුරජාණන් වහන්සේට අද වගේ උතුම් දිනයක දී හැකිවුණා. දමනය වූ පිරිස අතර සිටි ඒ පිරිසට නායක වූ උතුම් භික්ෂුව කස්සප නමින් හඳුන්වනවා. උරුවෙල් දනව්වෙහි දී උතුම් පැවිදි බිමට පැමිණි නිසා උරුවෙල කස්සප කියා බොහෝ දෙනා උන්වහන්සේ ඇමතුවා. ගෞතම බුදු සසුනේ මහා පරිවාර සම්පත්තියක් ඇති භික්ෂූන් වහන්සේලා අතර අග තනතුර ලැබුණේ ඒ උතුම් උරුවෙල කස්සප මහරහතන් වහන්සේට යි. ඉපදීමත් මරණයත් අතර දෝලනය වන මේ ජීවිතයේ සසර නැවත උපතකට හේතුවන සියල්ලගෙන් ම උන්වහන්සේ මිදුනා. දුර්ලභව ලැබුණු මනුෂ්‍ය ජීවිතයේ දී තමන් උදෙසා සිදුකර ගත යුතු ශ්‍රේෂ්ඨ වූ යමක් වේ ද එය උන්වහන්සේ විසින් සිදුකරගත්තා. සැබෑ සතුටක් උරුමකරදුන් මේ අසිරිමත් පරිවර්තනය හමුවේ උන්වහන්සේ තමන්වහන්සේගේ සිත තුළ උපන් ප්‍රීතිය මේ ලෙසින් වචනයට නැගුවා.

ගොයුම් ගොත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ මහත් වූ කීර්තිය තුන් ලොව හැම තැනකම පැතිරිලා තිබුණා. උරුවෙල් දනව්වෙහි දී උන්වහන්සේ විසින් ගිනිහල් ගෙයි සිටි දරුණු විෂ ඇති නාගරාජයා දමනය කිරීමෙන් ආරම්භ කළ ඒ මහා ප්‍රාතිහාර්ය සියල්ල ම මා දුටුවා. මේ සියල්ලට ම පසුව මට අනුකම්පාවෙන් තවත් වරක් උන්වහන්සේ මහා ජල කඳක් මැද ප්‍රාතිහාර්ය පෑම සිදුකළත් මා තුළ තිබුණ ඉරිසියාවත් මානයත් කියන පව්ටු ගති නිසා ඒ උත්තම බුදුරජාණන් වහන්සේ ගේ සම්බුදු ගුණයට කිසිවිටෙකවත් අවනත වුණේ නැහැ. උන්වහන්සේට වන්දනා කරන්නත්

මම පැකිලුනා. මහා විශාල ලාභයක් අතහැරෙන්නට ගිය මොහොතේ දී පුරිසදම්මසාරථී වූ ඒ උතුම් බුදු සමිඳු මගේ සිතුවිලි හඳුනාගත්තා. එක් මොහොතකින් උන්වහන්සේ මා සංවේගයට පත්කළා.

"කාශ්‍යප ය ඔබ අරහත් කෙනෙක් නොවේ. ඔබ අරහත්වයට පැමිණෙන මාර්ගයටවත් තව ම පැමිණ නැහැ. එවැනි උතුම් භූමියකට පැමිණෙන ප්‍රතිපදාවක් ඔබේ ජීවිතය තුළින් පෙනෙන්නේ නැහැ."

ඒ මොහොතේ දී අද්භූත වූ ලොමු දැහැ ගැනීමකින් මගේ මුලු ඇඟ ම කිලිපොලා ගියා. මට වහා නුවණ පහළ වුණා. මේ වෙලාවේ දී මම බුදු සමිඳුන් ගේ දෙපා මුල වැඳ වැටුනේ හදවතේ උපන් විශාල ගෞරවයකින්.

ඉස්සර ජටාවක් හිසේ බැඳගෙන තාපසයෙක් වගේ ඉන්න කාලයේ දී මට යම් යම් දේ කළ හැකි සුලු ඉර්ධියක් තිබුණා. මේ තත්ත්වය ගැන මම මොනතරම් දැඩි මානයකින් සිටියා ද. ඒ මානය නිසා හැම මොහොතකම දී ම භාග්‍යවතුන් වහන්සේ රහත් කෙනෙක් කියා මම විශ්වාස කළේ නැහැ. ඒ වුණත් මහාකාරුණිකයානන් වහන්සේ ගේ උතුම් බුදුගුණ හමුවේ, පහත් වූ ඒ මෝඩ අදහස් වලට නිග්‍රහ කරලා මම අතහැර දැමුවා.

බුදු හිමියන් ගේ දෙපා මුල වැඳ වැටුණු මා උන්වහන්සේගෙන් ඉල්ලා සිටියේ උතුම් සම්බුද්ධ ශාසනයේ මා පැවිදි කරගන්නා ලෙස යි. මගේ එකම පැතුම වුණෙත් එය යි. ඉතින් මටත් පුළුවන් වුණා බුදු සමිඳුන්ගෙන් ම උතුම් පැවිද්ද ලබා ගන්න.

කාම ලෝකය ම පතමින්, කාම ලෝකය ම ඉස්සර කරගෙන, කාමයන්ගෙන් සතුටු වෙමින්, යාග හෝම කරමින් ගිනි දෙවියන් පුදමින්, මෙතෙක් කල් රැඳී සිටි අවිද්‍යාවෙන්

මා මිදුනා. සුගතයන් වහන්සේ ගේ ශාසනයේ පැවිද්ද ලැබූ මා රාගයත්, ද්වේශයත්, මෝහයත් සම්පූර්ණයෙන් ම මේ ජීවිතයෙන් මුලිනුපුටා දැමුවා.

ඒත් සමග ම මට පෙර භවයන් දකින නුවණත්, බොහෝ දුර ඇති නිසා සාමාන්‍ය ඇසට දකින්නට නොහැකි දසුන් පවා දැකිය හැකි දිව්‍යස් නුවණත් ලැබුණා. අනුන්ගේ සිත් දකින නුවණත්, බොහෝ දුරින් ඇති දිව්‍ය මනුෂ්‍ය ශබ්ද ඇසීමට හැකි දිවකන් නුවණත් මට ලැබුණා.

මේ ලෝකයේ යම් කෙනෙක් ගිහි බන්ධනය අතහැරලා යම් උතුම් අරමුණක් පිණිස ද සම්බුද්ධ ශාසනයක පැවිදි බව ලබන්නේ, ඉතින් මටත් හැකිවුණා ඒ අරමුණ ඉටුකර ගන්න. සියලු බන්ධනයන් සිඳ දැමූ නිසා සියල්ලෙන් ම මිදුනු අයෙක් ලෙසයි මා දැන් ජීවත් වෙන්නේ. ඉපදෙන මැරෙන සංසාරේ නැවත උපතක් නම් මට නැහැ.

සිරිලක් දිවයින උතුම් සම්බුදු පහසින් පින්බර වුණ මේ උතුම් දුරුතු පොහොය දිනයේ දී නැවතුමක් පිණිස වූ උතුම් ඇරඹුමකට සිත් සකස් කරගන්න. වීර්යයෙන් දහමෙහි හැසිරෙන්න. කල්ප ගණනකට පසු ව දුර්ලභව අපට ලැබුණ මේ සුන්දර නිවන් මගෙහි ගමන් කරන්නට අදිටන් කරගන්න. ඔබත් මේ ලොව සැබෑ ම සතුටෙහි හිමිකරුවෙකු වේවා. ඒ උතුම් ඇරඹුමට පින්වත් ඔබ සැමට උතුම් උරුවෙල කාශ්‍යප මහරහතන් වහන්සේ ගේ ආශිර්වාදය වේ වා!

(කුදුගත් සඟියේ ථේර ගාථා පාලියේ උරුවෙල කාශ්‍යප මහ රහතන් වහන්සේ ගේ ථේර ගාථා ඇසුරෙන් සැකැසුණු ලිපියකි.)



# සුදනෙනි, සමඟි වව්!

බම්බලපිටිය සිරි වජිරාරාමාධිකාරීව වැඩවිසූ අති පූජ්‍ය කුඹුරුගමුවේ මහානාම ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

"සමග්ගා හොථ ! මා විවදථ"

("සුදනෙනි සමඟිවව් - වාද බේදත් නොකරව්.")

යන මේ ආදර්ශපාඨය ලෝවැස්සාට කාලෝචිත යහපත් අවවාදයෙකි.

මේ ලෝකයෙහි ඇති හැම ද්‍රව්‍යයක් පාසා එක් එක් බලයෙක් පවතී. ඒ ඒ ද්‍රව්‍යයන්ගේ සමවායෙන් (එක්වීමෙන්) පුදුම ශක්තියක් බලයක් ලැබෙන බව ප්‍රකට කාරණයෙකි.

අලංකාර මන්දිරයක් තනා ගන්නට අප කැමති නම් පළමු කොට හුණු ගඩොල් ලී ආදී නොයෙක් ද්‍රව්‍යයන් එක් රැස් කොට ශාස්ත්‍රානුකූල ව පිළියෙල කළ යුතු යි. එසේ සකස් කොට නොබෝ කලෙකින් පුදුම එළවන පහයක් නිර්මිත කෙරෙති. මේ ලෙසින් කල්පනා කරන අපට සිත් පිත් නැති ද්‍රව්‍යයන්ගේ සංයෝගයෙන් මෙබඳු

පුදුම එළවන දේ ඇති කරන්නට හැකි නම් සිත් පිත් ඇති මිනිස් සමූහයකගේ සමවායයෙන් කරන්නට බැරි දෙයක් ලෝකයේ නැතිතේ ම යයි වටහා ගත හැකි ය. ලෝකයෙහි දියුණුවක් ඇති කිරීමට ඔවුනොවුන් ගේ අන්‍යොන්‍ය සම්බන්ධය අත්‍යවශ්‍යක යි.

යම් රටෙකැ හෝ පෙදෙසකැ හෝ ගෙදරකැ අභිවෘද්ධියක් ඇතිවී නම් ඒ ඔවුන්ගේ සමඟියේ බලයෙනි. අද ලෝකයෙහි දියුණු වූ රටවල් ගැන සිතතොත් ඒ හැම රටවල් ම ඔවුනොවුන් ගේ සමඟියෙන් හා සහයෝගතායෙන් දියුණුවට ගිය බව අපට තේරුම් ගත හැකි ය.

අපේ පෙරදිග රටක් වූ ජපන් දේශය ගැන නුවණින් විමසා බලන කල්හි ඒ බව මැනැවින් වැටැහෙයි. ජපන් මනුෂ්‍යයෝ ඔවුන්ගේ රටට ඉතා ම ප්‍රේම කෙරෙත්. මනුෂ්‍යයන් වශයෙන් ද, ඔවුහු ඔවුනොවුන්හට ඉතා ම ආදරය කෙරෙමින් සමඟියෙන් තමන්ගේ දියුණුවට අයත් වැඩ යුහුසුලුව කර ගෙන යෙත්. යම් මනුෂ්‍ය ජාතියකගේ අන්‍යොන්‍ය සම්බන්ධයත් ප්‍රේමය ත් නොමැත්තේ නම් එබඳු රටෙහි ත් එබඳු මිනිසුන් කෙරෙහි ත් දියුණුවක් දක ගන්නට ලැබෙන්නේ කලාතුරෙකිනි. ඉතා සියුම් " හීන් නූල්" "පොල් කෙඳි" ආදි ද්‍රව්‍යයන් එක්රැස් කොට මහ කඹ අඹරා ශක්තිසම්පන්න ඇතුන් බැඳ නවතා තමන්ගේ කටයුතුවල යොදා ගනිත්. පළමුවෙන් කිසිත් ශක්තියක් නොමැති ව දුර්වල ව තුබූ නූල් පොල්කෙඳි ඈඳැ එක්වීමෙන් පුදුම ශක්තියක් බලයක් ලබා දෙන බව, අපට මනා ව වැටහෙයි. මේ පුදුම ශක්තියක් ඇති

සමඟිය සුන් කරන, භයානක භේද රාශියක් අප අතර තිබේ. රටුන් රටුන් සමඟ ද, රජුන් රජුන් සමඟ ද, ගම්මුන් ගම්මුන් සමඟ ද, නෑයන් නෑයන් සමඟ ද, සහෝදරයන් සහෝදරයන් සමඟ ද භේද වීම අන්තරායකරය.

තව ද ජාති භේද, කුලභේද, පංතිභේද, ආගම්භේද, පළාත් භේද, නිකාය භේද, කළු සුදු ආදී වර්ණභේද ද අප අතර එමට පවතිත්. මෙකී නොකී භේදයන් නිසා රටවල් පිරිහෙත්. එක ම මනුෂ්‍ය සංහතිය කල් යත් යත් නොයෙක් බෙදුමෙන් බෙදී ගියේ ය. එක ම සහෝදරත්වය නොයෙක් අතට බිඳී ගියේ ය.

විශේෂයෙන් මේ ජාතිභේදය, කුලභේදය දඹදිව් වැස්සන් අතර සහ ලක්වැස්සන් අතර බලපවත්නා බව රහසක් නොවේ. මෙයින් හවුරුදු දහස් ගණනකට ත් පෙරැ සිටැ පැවැත එන මේ ජාති භේදය, අති භයංකර වසංගතයෙකි. මේ භයංකර රෝගය අප අතරින් තුරන්වන තුරු අපට දියුණුවක් ලැබිය නොහැකි බව සක් සුදක්සේ පෙනේ.

අප ශාක්‍ය මුනීන්ද්‍රයාණන් වහන්සේ ලොව පහළ වූ කල්හි ත් මේ නින්ද කටයුතු රෝගය තුබූ බව "**න ජච්චා වසලෝ හෝති - න ජච්චා හෝති බ්‍රාහ්මණෝ, කම්මනා වසලෝ හෝති - කම්මනා හෝති බ්‍රාහ්මණෝ** " යි වදාළ වසල සූත්‍රයෙන් ප්‍රකාශ වේ. යමකු උපතින් වසලයකු නොවන බව ත්, බ්‍රාහ්මණයකු නොවන බව ත්, යමකුගේ ක්‍රියාවෙන් ම වසලයකු වන බව ත්, බ්‍රාහ්මණයකු වන බව ත් බුදුන් වහන්සේ වදාළ සේක.

මේ ලෙසින් ඒ මහා කාරුණිකයන් වහන්සේ දඹදිව් වැස්සන් ගේ ජාතිභේදයට විරුද්ධ ව සටන්කළ සේක. මෙහි ගතයුතු උතුම් දෙයක් තිබුණේ නම් ලෝකනාථයන් වහන්සේ මේ කුලභේදදියට නිගා නොකරන සේක.

තථාගතයන් වහන්සේ ශාක්‍ය ජාතියෙහි උපන් ශාක්‍ය රාජයෙකි. එතෙකුදු වුවත් උන්වහන්සේ මේ බුද්ධසාසනයෙහි නානා ජාතික නානා දේශික නොයෙක් උසස් පහත් කුල වලැ කුලපුත්‍රයන්හට මේ නොමනා භේදයන් නොසලකා පොදුවේ පැවිද්ද දුන් සේක. බුදුරජාණන් වහන්සේ පොදු ලෝකයා වෙත හුදු කරුණාව පෑ සේක. උත්තමයෝ මේ පහත් භේද චින්තා නූපදවත්.

සව්සතුන් කෙරෙහි සම මෙත් පතුරුවත්. මේ ලෝකයෙහි ඇති තාක් උත්තම වස්තූහු ලෝක සත්ත්වයා කෙරෙහි සමසේ පැතිරෙත්. සූර්‍ය රශ්මිය ත්, ජලය ත්, වැසි සුළං, යන ආදිය ත් උසස් පහත් හැම දෙනා කෙරෙහි ම සමසේ පවතී.

මේ උතුම් වෙසක් පොහෝ දිනයෙහි හැම දුර්ගුණයෙන් වෙන්වැ සාධුගුණයෙහි පිහිටා පොදුවේ හැම දෙනා කෙරෙහි ම සහෝදරත්වයෙන් වෙසෙන්නට උනන්දු වෙත් වා!

බුදුකුරු දම් පුරන - සියලුබෝසත්වරුනු දු
හසළ ගුණයක් වේ මෙය - නිතියෙන් සිහිකරත්වා!

සමඟි දහමෙහි වුසු - මෙ අප මහසත් සිරිතින්
වටු වැ ඉපැදුණු දූයෙහි දු - ලොවට එහි බල පළ කළ

සියලු ලෝවැසියන් - සියන් මෙන් නිති සිතමින්
නොමින් සතහට සෙතදුන් - උපන් ඒ ඒ දැහී

නමකර එ උතුමන් - පුදකර සැම පිළිවෙතින්
සමඟි වන්නට සිතතොත් - මැනැවි මෙ වෙසඟපෝද......

**සාධු ! සාධු ! සාධු !**

(බු.ව 2484, බෞද්ධ ළමයා, වෙසක් කලාපය)

සබ්බදා සීලසම්පන්නෝ
පඤ්ඤවා සුසමාහිතෝ
අජ්ඣත්තචින්තී සතිමා
ඕඝං තරති දුත්තරං

(යමෙක්) සෑම කල්හි ම සිල්වත්ව, නුවණින් යුතුව, මනා ලෙස ඇති කරගත් චිත්ත සමාධියෙන් යුතුව, ආධ්‍යාත්මයට යොමු කරන ලද සිතුවිලි වලින් යුතුව, සිහි ඇත්තෙක් ව වාසය කරත් නම් (හෙතෙම) තරණයට අපහසු වූ සසර සැඩ පහර තරණය කරන්නේ ය.

(හේමවත සුතුර)



# කච්ඡප ජාතකය

විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණි
ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි.

තිලෝගුරු අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ එක් වස්සාන කාලයක සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන කල, එක් භික්ෂුවක් අරබයා මෙම ජාතක ධර්මය වදාළ සේක.

වස්සාන ඍතුව ඇසළ මස අව පෑළවියේ සිට ඉල් මස පුන් පොහෝ දින දක්වා දිවෙයි. මෙම හාර මාසය ගස් වැල් කොළ පැහැයෙන් බබළන. ගංගා ඇල දෙළ පිරී ඉතිරී යන වැසි සමයකි. බුදුරජාණන් වහන්සේ පනවන ලද නීති රීති අනුව, භික්ෂූහු ආරණ්‍ය, සෙනසුන් තුළ, වැඩ වසමින් සූත්‍ර, අභිධර්මය මෙනෙහි කරමින් වස් විසීමෙන් පසුව තුන් මාසකින් වස් පවාරණය කළහ. මේ වස් සමය තුළ දායකයින් ද භික්ෂූන් වස් වස්සවා, සිව් පසයෙන් උපස්ථාන කොට පින් ලබා ගත්හ. යහපත් ගුණ ධර්ම දියුණු කර ගත්හ.

එම වස්සාන සමයේ සැරියුත් මුගලන් අගසව් රහතන් වන්සේලා වස් විසීම සඳහා වැඩියේ, කෝකාලික තෙරුන් වැඩ වාසය කරනා, ශාන්ත පරිසරයක පිහිටි ආවාසයටය. තමන් වහන්සේලා පැමිණි බව කිසිවෙකු හට සැල නොකරන ලෙස අගසව් දෙනම කෝකාලික තෙරුන්ගෙන් ඉල්ලා

සිටියහ. තෙමසකට පසුව උන්වහන්සේලා වස් පවාරණය කොට සැවැත් නුවර බලා වැඩම කරනා විට කෝකාලික තෙරුන් ගම් සීමාව දක්වා පසු ගමන් ගියහ. නැවත ආවාසය වෙත තෙරණුවෝ පැමිණියේ ගම් වැසියනට දොස් පවරමිනි.

"දයකයිනි, නුඹලා ඉතා අඥනවන්තයි. සතුනට මෙන් ස්ථානෝචිත ප්‍රඥව නොමැත. පන්සලට නිතර පැමිණි දයකයින් අගසව් දෙනම මේ ආවාසයේ තුන් මසක් වස් විසූ බව නොදන්නෙහි ද? වස් පවාරණය කළ උන්වහන්සේලා දැන් සැවැත් නුවරට වඩින්නාහ. යනුවෙන් අවලාද නැගූහ.

මේ පුවත අසා කම්පාවට පත් උපාසක උපාසිකාවෝ අගසව් දෙනම වෙත පූජා කිරීමට පිරිකර ලෙස සිවුරු, ගිතෙල් ආදිය රැගෙන ගියහ. කෝකාලික තෙරුන් ද උපාසකයනට එකතු වූහ. මඟ දී මුණ ගැසුනු සැරියුත්, මුගලන් රහත්හු එසේ පිරිකර පිළිගැනීම නුසුදුසු නිසා පිරිකර භාර නොගත්හ. කෝකාලික තෙර සිතුයේ අගසව් දෙනම පිරිකර පිළිගෙන තමන් වහන්සේට දෙනු ඇතැයි කියා ය. නමුත් උන්වහන්සේලා එසේ නොකල නිසා කෝකාලික තෙර අගසව් දෙනමට දෙස් පැවරූහ. රහතුන් වහන්සේලාට දෙස් පැවරීම තද බල පාපකර්මයක් බැවින්, අගසව් දෙනමගේ ගුණ සිහිකර කොපය නිවාගන්නැයි බුදුහු අවවාද කළ සේක. එම අනුශාසනා කෝකාලික තෙර ඉවත දැමූ විගස ම විපාක ලැබුණි. ශරීරයේ විසර ගෙඩි මතුවී සැරව ගලන්නට විය. වේදනාව ඉහිලුම් නැතිවිය. මේ වේදනාවෙන් මිදෙන්නට නම් අගසව් දෙනම වෙතින් සමාව ගත යුතු බව තුදු නම් බ්‍රාහ්මණයා පහදා දුනි. කෝකාලික තෙර ඔහුට ද පරිභව කළේ ය. අවසානයේ එම වේදනාවෙන් ම කෝකාලික තෙර මරණයට පත් වී පදුම නමින් යුත් අපායෙහි ඉපදුනි.

එදින දම් සභාවෙහි කතිකාවතට බඳුන් වූයේ කෝකාලික පුවතයි. පෙර භවයන්හි දී ත් කෝකාලික තෙර තම කට නිසා විනාශ වූ බව බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූනට අතීත කථාවක් අනුසාරයෙන් පහදා දුන් සේක.

පෙර කල බරණැස බඹදත රජ කල අප මහා බෝසතාණෝ අමාත්‍යවරයෙකු විය. රජුගේ වාචාල බව අමාත්‍ය වරයාට කන්දෙස්කිරියාවකි. මෙය පාලනය කළ යුතු බව ඔහු සිතමින් සිටිය දී ඉදිබුවෙකුට වූ විපතක් පිළිබඳව ආරංචි විය.

හංසයින් දෙදෙනෙකු හා ඉදිබුවෙකු මිත්‍රව සිටියහ. ඔවුන් හිමාලයේ නිල්වන් ජල පිරි පොකුණකටත්, රන්වන් ගුහාවකටත් යාමට සිතූහ. තමාට පියාඹා යාමට නොහැකි බව ඉදිබුවා පැවසූ කල කට රැකගතහොත් ගෙන යා හැකි බව පවසා සවිමත් කෝටුවක දෙකොනින් අල්ලා, මැදින් ඉදිබුවාට කටින් එම ලීය හපා ගෙන සිටින ලෙස අවවාද කර හංසයින් දෙදෙනා ඉදිබුවා රැගෙන අහසින් පියාඹා ගියහ. අහසේ යන ඉදිබුවා දුටු කොලු රැළක් උසුළු විසුළු කළහ. ඔවුනට බැන වැදිය යුතු යැයි සිතා කට අරිනවාත් සමඟ ම බිම වැටී මරණයට පත් විය. මෙය බැලීමට රජු, අමාත්‍යවරයා මෙන් ම වැසියන් ද පැමිණියහ.

ඉදිබුවාට මෙසේ සිදුවූ කාරණය රජුට විස්තර කළ විට "ඇමතිතුමනි ඔබ මෙසේ පවසන්නේ මා හට දැයි විමසීය. මෙය පාඩමක් කරගතහොත් අගනේ යැ යි පැවසූ බෝසතාණෝ රජු හට, තමා මින් පසු අවස්ථාවට සුදුසු වන ප්‍රිය වචන භාවිතා කිරීමට අදිටන් කළ බව පැවසීය. මෙය බාල මහළු අප කාහටත් හොඳ පාඩමකි.

එකල හංසයින් දෙපළ අගසව් දෙනමය. ඉදිබුවා වූයේ කෝකාලික තෙරුන් ය. අමාත්‍යවරයා වූයේ අප මහ තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහනසේ ය.



## ළමා පෙළට මංගල සුතුර - 1

# අසේවනා ච බාලානං

ගුරු සීයා විසිනි.

හැම දුකට ම කරුණ
ඇසුරු කැරුම යි දනන් අනුවණ
බිය දෙයි සියලු තැන
දුරින් දුරු කළ යුතු ය දද දන

මෙ ලොවට පරලොවට
දුක් සෝ තැවුල් එක් කොට
ගෙන දෙයි හැම ගැහැට
බාලයන් හා ඇසුර සැම විට

මස් කඩක් දුගඳැති
එතුව හොත් රෙදි කඩක සුවඳැති
දුගඳ ම එහි නවති
බාල ඇසුර ද ඒ ලෙස වනු ඇති



“දුදන නො දකිම්වා
ඔහු බසක් නො අසම්වා
එක් ව විසුමක් - දෙඩුමක්
කිසි කලෙක නො ලබම්වා”

අකිත්තී පඬි තෙම
අයැදියේ දෙවිඳු ගෙන් මෙ වරම
ඒ තරම් දරුණුතම
දෙසක් වේ බාලයකු ඇසුර ම

ළමා පෙළ පින්වත්
උතුම් බෝසත් මඟ ගත්
දැන ඇසුරෙහි විපත්
බාල පව් මිතු දනන් දුර ලත්